# කෘෂිකර්ම අමාත්‍යාංශය
# கமத்தொழில் அமைச்சு
# Ministry of Agriculture

"ගොවිජන මන්දිරය", 80/5, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.
"கொவிஜன மந்திரய", 80/5, ரஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
"Govijana Mandiraya", 80/5, Rajamalwatte Avenue, Battaramulla, Sri Lanka.


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. NFS/FCG(3)2016/17/Maha(Guide) | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2016.08.19 |

කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

මහවැලි අධ්‍යක්ෂ ජනරාල්

පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්

සියලුම ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්

සියලුම ගොවිජන සංවර්ධන නිලධාරීන්

## වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කරන ගොවීන්ට පොහොර සහනාධාර මුදල් ලබා දීම ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් (2016 වර්ෂය)

### කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර / මහවැලි ඒකක කළමනාකරු / ග්‍රාම නිලධාරී /සංවර්ධන නිලධාරීන්ගේ කාර්යභාරය

**අයදුම්පත්‍ර නිකුත් කිරීම / භාර ගැනීම හා නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම**

1. 2016 වර්ෂයේ වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කළ හෝ වගා කරන ගොවීන් සියලුදෙනා වෙත ඉල්ලුම්පත්‍ර ලබා දීමට කටයුතු කරන්න. (2016 සඳහා මුද්‍රිත H ඉල්ලුම්පත්‍රය පමණක් වලංගු වේ.)

2. 2016 සහනාධාර ලාභීන්ගේ ලේඛනය ගොඩ ඉඩම් හිමි නාම ලේඛනයේ ඒ ඒ ඉඩමට අදාළ ඉඩම් අංකය සටහන් කර නාම ලේඛනය සකස්කර, ඒ අනුව ග්‍රාම සේවා වසම් අනුව ඉල්ලුම්පත්‍රවල ඉල්ලුම්පත්‍ර අංක යොදා ලේඛනයේ අනු පිළිවෙලින් ගොවීන් වෙත ඉල්ලුම්පත්‍ර ලබා දෙන්න. (එකවර ගොවි සංවිධාන කැඳවා එම කටයුත්ත සිදු කිරීම පහසුවනු ඇත.) (මහවැලි බල ප්‍රදේශවල ඊට අදාළ ඉඩම් කට්ටි කර ඇති ලේඛනයෙන් ඒ ඒ ගොවියාට අදාළ ඉඩම් අංක යොදා ගත යුතුය). ඉල්ලුම්පත්‍ර නිකුත් කිරීම හා නැවත ලැබීම් සටහන් කර ගන්න.

3. මෙම සහනාධාරය හිමිවන්නේ අල, ළූනු, මිරිස්, සෝයා හා බඩ ඉරිඟු වගාවන් සඳහා පමණක් වන අතර 2016 වී පොහොර සහනාධාර හිමි ගොවීන් හෝ තේ, පොල්,රබර් සහනාධාර හිමි ගොවීන්ට හිමි නොවේ.

4. ඉල්ලුම්පත්‍රයේ දකුණුපස ඉහල කෙලවරේ කේත අංකය (අනු අංකය) ලබා දිය යුත්තේ දත්ත පරිගණකගත කිරීමේදී ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී බැවින් අදාළ ස්ථානයේ කිසිවක් සටහන් නොකිරීමට වගබලා ගන්න.

5. එකම ඉල්ලුම්පත්‍ර අංකය සහිතව හෝ එකම කේත අංකය සහිතව ඉල්ලුම්පත්‍ර දෙකක් හෝ කිහිපයක් නොතිබිය යුතුය.